ලංකා සෝල්ට් ලිමිටඩ් - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

ලංකා සෝල්ට් ලිමිටඩ්හි 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයන් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාවනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳාපවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්කර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේදී කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර තිබුණි. කෙසේ නමුත් කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයක් හඳුනාගැනීමේ නිර්ණායක ලංකා සෝල්ට් ලිමිටඩ් විසින් තෘප්ත නොකරන බැවින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම නිසි මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල වී නොතිබුණි.	කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කිරීමට බාධාවක් නොමැති බව පෞද්ගලික විගණන ආයතනයක් පැවසූ බවත් මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කරන බව.	ඉදිරි වර්ෂයන් සඳහා සමාගම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කළ යුතු වේ.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වුවත්, සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ පිරිවැය රු.313,464,630 ක් වූ ජංගම නොවන වත්කම් අතරින් තවදුරටත් භාවිතා කරනු ලබන වත්කම් හඳුනාගෙන ඒවායේ ඵලදායී ජීව කාලය නිවැරදිව සමාලෝචනය කර, හඳුනා ගන්නා ඇස්තමේන්තුගත දෝෂ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 32 ඡේදය ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.	ස්ථාවර වත්කම් සත්‍යාපන විගනණය තවමත් අවසන් වී නොමැති බව.	ප්‍රමිතිය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 10 ඡේදය ප්‍රකාරව කළමනාකරණ විනිශ්චයන් මත පදනම්ව සමාගමේ අසම්භාව්‍ය බැරකම් හඳුනාගෙන ප්‍රමිතියේ 86 ඡේදය ප්‍රකාරව ඒවා මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාගමට එරෙහිව පවරා තිබුණු නඩුවකට අදාළව අසම්භාව්‍ය බැරකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.	හෙළිදරව් කිරීමට එකඟ වන බව.	නඩුවට අදාළ අසම්භාව්‍ය බැරකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී සහ ඉකුත් වර්ෂයේදී පොල් වගාව වෙනුවෙන් දරා තිබුණු රු.16,980,468 ක වියදම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41 ට අනුකූල නොවන ලෙස වර්ෂයේ අයහාර වියදම් ලෙස හඳුනාගෙන තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් වර්ෂයේ වත්කම් වටිනාකම හා ලාභය අඩුවෙන් නිරූපණය වී තිබුණි.	වත්කමෙහි සාධාරණ අගය ඉක්මවා ගොස් ඇති බැවින් පුනරාවර්ථන වියදම් ප්‍රාග්ධනිත කළ නොහැකි බව.	මුළු වියදම ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් නිවැරදිව හඳුනාගෙන ප්‍රාග්ධනිත කළ යුතුය.
(ඉ) ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 ප්‍රකාරව හානිකරණ අගයන් සඳහා ගැලපීම් කර නිවැරදි ධාරණ අගයට ඉදිරිපත් කිරීමෙන් තොරව මහලේවායේ තිබෙන පීදුණු හා නොපීදුණු පොල් ගසක් රු.12,500 ක පිරිවැයකට සහ බුන්දල ලේවායේ පීදුණු හා නොපීදුණු පොල් ගසක් රු.61,313 ක් බැගින් පිරිවැයට අගය කර තිබුණි. එමෙන්ම ඉහත පිරිවැයන් මත පීදුණු පොල් ගස් 443 ක් හා නොපීදුණු පොල් පැළ 262 ක් අගය කර ගිණුම්ගත කිරීමේදී රු.5,467,793 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.	පොල් වගාවට අදාළ ගිණුම්කරණ සටහනට තවදුරටත් විස්තර ඇතුළත් කිරීමට එකඟ වන බව.	ජීව විද්‍යාත්මක වත්කම් අදාළ ප්‍රමිතිය ප්‍රකාරව හානිකරණ පරීක්ෂාවන් සිදුකර හානිකරණ අලාභයන් පැන නඟීනම් නිවැරදි වටිනාකම ගැලපීම් කර නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන් යටතේ ගිණුම්ගත කර තිබූ එකතු වටිනාකම රු.26,132,083 ක් වූ ශේෂයන් වර්ෂ 1 සිට 4 දක්වා කාලයක් අය නොවී පැවතියද, ඒ සඳහා හානිකරණ පරීක්ෂාවන් සිදුකර අවශ්‍ය වෙන් කිරීම් ගිණුම්වල සලසා නොතිබුණි.	තවදුරටත් විමසීම් සිදුකළ යුතු අතර අය කර ගැනීමට කටයුතු කරන බව.	හානිකරණ පරීක්ෂාවක් සිදු කිරීමට පැහැදිලි හේතු තිබෙන නිසා මෙවැනි ශේෂයන් සඳහා හානිකරණ පරීක්ෂාවක් සිදුකර මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් කළ යුතු අතර, ණය ශේෂ කාලීනව අය නොකිරීමට සම්බන්ධව අදාල වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.

(ආ) අයහාර සංචිත ලෙස පෙර වර්ෂයක මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.4,966,100 ක් වූ ප්‍රත්‍යාගණන සංචිතය පෙර වර්ෂයකදී රඳවාගත් ඉපයීම්වලට මාරු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ද එම දෝෂය නිවැරදි කර නොතිබුණු බැවින් රඳවාගත් ඉපයුම් රු.4,966,100 ක් වැඩියෙන් සහ ප්‍රත්‍යාගණන සංචිතය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේදී නැවත පෙර තිබූ ආකාරයට පත් කිරීමට එකඟ වන බව.	අදාළ අගය රඳවාගත් ඉපයීම්වලින් ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කර ගිණුම් නිවැරදි කළ යුතුය.
(ඇ) විගණනය විසින් සිදු කළ ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබූ ස්ථාවර තැන්පතු ආයෝජන හා ස්ථාවර තැන්පතු පොලී ලැබීම් එකතුව රු.434,218,662 ක් වැඩියෙන් දක්වා තිබූ අතර, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබූ ආදායම් බදු හා ලාභාංශ ගෙවීම් වටිනාකම රු.38,892,627 ක් අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදිව ගැලපීම් සිදුකර ඇති අතර ඒවායේ වෙනසක් සොයා ගැනීමට නොහැකි බවත් ඉදිරි වර්ෂයේ සිට තවත් විස්තරාත්මකව ඉදිරිපත් කිරීමට එකඟ වන බව.	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සෙසු මූල්‍ය ප්‍රකාශන ශේෂයන් මත පදනම්ව නිවැරදිව පිළියෙල කළ යුතු අතර, නොසැසඳීම් නිවැරදි කිරීමට පියවර ගත යුතුය.
(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට තොගයෙහි ඇතුළත් වූ Common Salt වටිනාකම ලුණු අට්ටිවල ප්‍රමාණය අනුව මිනුම් කිරීමේදී රු.2,484,094 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	අවසන් ගිණුම් වාර්තා සැකසීමේදී තොග අගය ලෙස මොරටුව විශ්ව විද්‍යාලය විසින් විද්‍යාත්මක ක්‍රමවේදයකට ගණනය කළ තොග වටිනාකම ගිණුම් ගත කළ අතර ගිණුම් සකසන අවස්ථාව වන විට එම තොග භාවිතයට ගෙන නොතිබූ බැවින් ගැලපීම් සිදු කිරීමට අවශ්‍ය නොවූ බව.	වර්ෂයේ අවසාන තොගය නිවැරදිව අගය කර ගිණුම්ගත කළ යුතුය.
(ඉ) 2025 වර්ෂයේ මාර්තු මස නොනිමි ලුණු ලෙස පැවති රු.47,498,405 ක තොගයක් 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර තිබුණද, පැවති අයහපත් කාලගුණ තත්ත්වය මත එම තොග තවදුරටත් පෙරසැරි කිරීමට නොහැකි වී තිබූ බැවින් නොනිමි තොගය වැඩියෙන් ගිණුම්ගත කර තිබීමෙන් සමාගමේ ලාභයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ප්‍රතිපත්ති අනුව ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යය (WIP) නිවැරදි බව.	ශේෂපත්‍ර දිනට පසු සිද්ධියක් ලෙස හඳුනාගෙන ගැලපීම් කළ යුතුය.
(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් යටතේ ඉදිකිරීම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.3,941,786 ක් වූ ඉදිකිරීම්, වර්ෂය තුළ නිමකර තිබුණත් ඒවා අදාළ වත්කම් පංති වලට මාරු කර නොතිබූ අතර ඊට අදාල ක්ෂයවීම්ද ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිකිරීම් අවසන් වී නොමැති බව.	වර්ෂය තුළදී නිමකළ මෙම ඉදිකිරීම් අදාළ වත්කම් පංතියට මාරු කර ක්ෂය කිරීමද ආරම්භ කළ යුතුය.

(උ)	ගොඩනැගිලි වත්කම් පංතිය තුළ ඇතුළත් කර ඇති ජල සම්පාදන පද්ධතියේ (Water Supply Scheme) නිශ්චිතව වෙන්කොට හඳුනාගත හැකි රු.1,174,921 ක් වූ ප්ලාස්ටික් වතුර ටැංකි 101 ක් සහ රු.253,725 ක් වූ බවුසර් ටැංකි 04 ක්ද ඇතුළත් කර තිබුණු අතර, ඒවා වෙනම වත්කම් කාණ්ඩයක් ලෙස ඊට අදාළ අනුපාතය යටතේ ක්ෂය කිරීමෙන් තොරව ගොඩනැගිලි ක්ෂය අනුපාතය යටතේම වසරකට සියයට 2.5 බැගින් ක්ෂය කරමින් පැවතුණි.	වත්කම් සත්‍යාපනයෙන් පසුව නිවැරදි කිරීමට එකඟ වන බව.	ගොඩනැගිලි වත්කම් යටතට අයත් නොවන මෙම වත්කම් වෙනම වත්කම් කාණ්ඩයක් ලෙස හඳුනාගෙන ඒ අනුව ක්ෂය කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් වල ගිණුම්ගත කර තිබූ ඉදිකරමින් පැවති වත්කම් වල වටිනාකම රු.18,297,580 ක් වුවත්, එම ඉදිකිරීම් වලට අදාළ රැකියා පත්‍ර පරීක්ෂාවේදී ඉදිකිරීම් 05 කට අදාළව පිරිවැය රු.2,528,037 ක් වැඩියෙන් සහ ඉදිකිරීම් 03 කට අදාළව පිරිවැය රු.449,226 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	සත්‍ය වටිනාකම රැකියා පත්‍ර වලට ගෙන නොමැති බව.	ඉදිකිරීමට අදාළ ප්‍රභව ලේඛන වල සටහන් කර තිබෙන වටිනාකම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(එ)	2019 වර්ෂයේ ලුණු ප්‍රවාහනයෙන් ලැබී තිබුණු ආදායම්වලින් රු.7,579,030 ක මුදලක් අස්ථානගත වී තිබුණු අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ප්‍රවාහන ආදායම් ලෙස දක්වා සම්පූර්ණ වටිනාකම සඳහාම අඩමාන ණය වෙන්කර තිබුණ ද, මෙම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු හෙළිදරව් කර නොතිබූ අතර, අදාළ වටිනාකම ඊට අදාළ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.	හෙළිදරව් කිරීමට එකඟ වන බව.	මූල්‍ය වංචාව සම්බන්ධයෙන් පැහැදිලි සහ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනයන් තුළ සිදු කළ යුතු අතර, විධිමත් පරීක්ෂණ පවත්වා මීට සම්බන්ධ පාර්ශවයන්ගෙන් මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.3 නොසැසඳුනු ශේෂ

	විෂය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.)	අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.)	වෙනස (රු.)	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජීව විද්‍යාත්මක වත්කම් පිරිවැය	16,280,233	23,917,531	7,637,298	ප්‍රාග්ධනිත කරන අවස්ථාවේදී බාහිර පෞද්ගලික විගණන ආයතනයක් විසින් කපාහරින ලද වටිනාකමක් බව.	අදාළ ශේෂවල වෙනස්කම් සසඳා අදාළ නිවැරදි කිරීම් සිදු කළ යුතුය.

(ආ)	ජීව විද්‍යාත්මක වත්කම් සමුච්චිත ක්ෂය	2,092,375	9,729,673	7,637,298	ප්‍රාග්ධනිත කරන අවස්ථාවේදී බාහිර පෞද්ගලික විගණන ආයතනයක් විසින් කපාහරින ලද වටිනාකමක් බව.	අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් සිදු කළ යුතුය.
(ඇ)	අසේවකයන් 16 ක් සඳහා ලබාදුන් ආපදා හා උත්සව ණය ශේෂයන්	4,485,010	4,465,914	782,855	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් සිදු කළ යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
දේපළ පිරියත හා උපකරණ	1,693,182,851	ස්ථාවර වත්කම් රෙජිස්ටරය හා වාර්ෂික සමීක්ෂණ වාර්තා	වත්කම් සත්‍යාපනය සිදු කරමින් පවතින බව සහ ස්ථාවර වත්කම් රෙජිස්ටරය Microsoft Excel ගොනුවක් ලෙස පවත්වාගෙන යන බව.	ස්ථාවර වත්කම් රෙජිස්ටරයක් නඩත්තු කිරීමට හා එය විගණනයට ඉදිරිපත් කිරීමටත් සහ වාර්ෂිකව වත්කම් සමීක්ෂණයක් සිදු කිරීමටත් කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
දේශීය මිලදීගැනීම් සඳහා ලබාදුන් අත්තිකාරම් අදාළ කාර්යයන් ඉටුවී වහාම පියවිය යුතු වුවද, 2012 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 37 කදී පියවා නොතිබුණු අත්තිකාරම්වල එකතු වටිනාකම රු.9,220,092 ක් විය.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිම වූ විගසම පියවීමට කටයුතු කළ යුතු අතර අත්තිකාරම් පියවා නොමැති නිලධාරීන් සම්බන්ධව විධිමත් පරිදි කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2 ඡේදය	ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා විස්තරාත්මක ප්‍රසම්පාදන කටයුතු දැක්වෙන අනුමත ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	සැලසුම් සකස් නොකළ නිලධාරීන් සම්බන්ධ විධිමත් පියවර ගැනීමටත් ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016	ආයතනය සතු වාහන 19 ක් සඳහා ඉන්ධන දහනය පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය
(ඇ)	2016 අප්‍රේල් 25 දිනැති 2/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය	රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් සංශෝධනයන්ට අදාළව රාජ්‍ය සමාගම්වල කාර්යමණ්ඩල බඳවාගැනීම් පටිපාටිය (SOR) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගත යුතු වුවත්, 2024 දෙසැම්බර් 31 දින වන විටත් සමාගම එකී නියමය පරිදි කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.701,444,864 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.1,190,670,867 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.489,226,003 ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා විකුණුම් ආදායම අඩුවීම සහ විකුණුම් පිරිවැය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී විකුණුම් ආදායම සියයට 14 කින් අඩු වී විකුණුම් පිරිවැය සියයට 16 කින් වර්ධනය වී තිබුණි. මේ අනුව පෙර වර්ෂය හා සැසඳීමේදී ආයතනයේ විකුණුම් ඒකක ප්‍රමාණය අඩු වී ඒ අනුව

ආදායම අඩු වී තිබුණද ඒ වෙනුවෙන් දරා තිබූ විකුණුම් පිරිවැය වැඩිවීම සඳහා Common Salt නිෂ්පාදනයට අදාළ ඍජු වියදම් හා කාර්ය මණ්ඩල වියදම් ඉහළ යාම හේතු වූ බැවින් ආයතනයේ පිරිවැය කළමනාකරණය අයහපත් තත්වයක පවතින බව නිරීක්ෂණය විය.

2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව ජංගම අනුපාතය 2.83 සිට 2.76 දක්වා සුළු අඩු වීමක් තිබුණත් අවම අවශ්‍යතාවය සපුරා ඇත. ක්ෂණික වත්කම් අනුපාතය 2.17 සිට 2.40 දක්වා යහපත් වෙනස් වීමක් නිරීක්ෂණය කෙරේ. දළ ලාභ අනුපාතය සියයට 53 සිට 37 දක්වාද ශුද්ධ ලාභ අනුපාතය සියයට 30 සිට 20 දක්වාද අඩු වී තිබුණි. ඒ අනුව, සමාගමේ ලාභදායීත්වය සැලකිය යුතු ලෙස අඩු වී තිබූ බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා විකුණුම් ආදායම අඩුවීම, ජීව විද්‍යාත්මක වත්කම් ක්ෂයවීම් ඉහළ යාම සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 පෙබරවාරි 21 දින සිට 2024 මැයි 09 දින දක්වා කාර් රථයක් සඳහා අවස්ථා 20 කදී එකතු වටිනාකම රු.224,431 ක් වූ ඉන්ධන ලීටර 605ක් ලබාගැනීමට ඉන්ධන ඇණවුම් නිකුත් කර තිබූ නමුත්, දෛනික ධාවන සටහන් අනුව අවස්ථා 12 කට අදාළ එකතු වටිනාකම රු.133,888 ක් වූ ඉන්ධන ලීටර් 361ක් පමණක් සටහන් කර තිබුණි. ඉතිරි අවස්ථා 08 වෙනුවෙන් ඇණවුම්පත් කාර්යාල කාර්ය සහායකවරයෙකු විසින් ලබාගෙන තිබුණද ඉන්ධන නොගෙන ලීටර් 244ක් සඳහා රු. 90,543ක් ගෙවා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 24 දින නිකුත් කළ ඇණවුම සඳහා රු.11,872 ක් වූ ඉන්ධන ලීටර් 32 ක් ලබාගත් බවට බිල්පත් ඉදිරිපත් කර තිබුණත් එකී ඉන්ධන ප්‍රමාණයන් රථයට සපයා නොතිබුණි.	ඉන්ධන අවභාවිතයක් සිදුවී ඇති බවට එකඟ වන බවත්, සභාපතිතුමාගේ උපදෙස් පරිදි අදාළ ඇණවුම් වලට ගෙවීම් නතර කරන බව පිරවුම්හල වෙත ලිඛිතව දන්වා ඇති බව.	විධිමත් පරීක්ෂණ පවත්වා අදාල නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමටත්, ඉන්ධන අවභාවිතාව නිසා සිදුවූ පාඩුව අදාළ පාර්ශවයන්ගෙන් අයකර ඉන්ධන නිකුත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමය විධිමත්ව ස්ථාපිත කිරීමත් කළ යුතුය.
(ආ)	හයිඩ්‍රොලික් තෙල් (HD – 68) සඳහා උපරිම, අවම සහ ආරක්ෂිත තොග මට්ටම් පවත්වා නොගැනීම නිසා 2024 ජුනි 07 දින හයිඩ්‍රොලික් ඔයිල් නොමැති වීමෙන් මේස ලුණු නිෂ්පාදන අංශයේ නිෂ්පාදන කටයුතු කරගෙන යාමට සහය වන යන්ත්‍ර නොපැමිණීම නිසා එදිනට සමාගමට අහිමි වූ නිෂ්පාදන වටිනාකම රු.811,617 ක් විය.	මේස ලුණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 12 ක ප්‍රමාණයක් අහිමි වී ඇති බව.	තොග නොමැති වීමෙන් අහිමි වූ නිෂ්පාදන වටිනාකම විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගම විසින් ඉකුත් වර්ෂයේ ලාභයෙන් නිසි අධිකාරීත්වයකින් තොරව රාජ්‍ය හිමිකාරීත්වය නියෝජනය කරන අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයින් 05 දෙනෙකු සඳහා 2023 වර්ෂයේදී රු.625,000 ක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි.	අධ්‍යක්ෂකවරු 05 දෙනාගෙන් තිදෙනෙකු ප්‍රසාද දීමනා මුදල ආපසු ගෙවා ඇති බව.	අධ්‍යක්ෂකවරුන් වෙත ගෙවන ලද හිමිකමක් නොමැති ප්‍රසාද දීමනා ඉතිරි ශේෂයද කඩිනමින් අය කර ගත යුතුය.
(ආ)	2024 මාර්තු 18 දින සහකාර සාමාන්‍යාධිකාරී අභ්‍යන්තර විගණන තනතුර සඳහා ලබාදී තිබූ සංශෝධිත පත්වීම් ලිපියේ වගන්ති අංක 10 අනුව සමාගම නිල නිවාස ලබාදීමට බැඳී නොමැති බවත්, ලබා දෙන්නේ නම් ආර්ථික කුලිය අයකරන බවට සඳහන්ව තිබුණි. එහෙත් විධිමත් අනුමැතියකින් තොරව 2023 ඔක්තෝබර් 23 දින සිට 2024 ඔක්තෝබර් 14 දින දක්වා දින 355 ක් මහලේවායේ සංචාරක නිවාඩු නිකේතනයේ නවාතැන් පහසුකම් ලබාගැනීම මත දිනකට රු.2,500 ක් බැගින් රු.887,500 ක් මෙම නිලධාරියාගෙන් අයකරගත යුතු වුවත්, එය අයකරගෙන නොතිබූ අතර මෙම මූල්‍ය නොවන ප්‍රතිලාභය මත පෙර ගෙවිය යුතු පුද්ගලික ආදායම් බදු (Advance Personal Income Tax – APIT) ද අයකරගෙන නොතිබුණි. 2024 දෙසැම්බර් මාසයේදී නිලධාරියා හට නිල නිවාසයක් ලබා දුන්නද, එය භාරගෙන නොමැති බව ද තවදුරටත් නිරීක්ෂණය විය.	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත ඉදිරියේදී මුදල් අයකර ගැනීමට කටයුතු කරන බවත් එය මූල්‍යමය නොවන ප්‍රතිලාභයක් ලෙස සලකා පුද්ගල ආදායම් බදු ගණනය කිරීමට නොහැකිව ඇති බව.	පත්වීම් ලිපියේ සඳහන් වගන්ති අනුව කටයුතු කිරීමත්, කුලිය සහ පෙර ගෙවිය යුතු පුද්ගලික ආදායම් බදු අය කිරීමත් කළ යුතුය.
(ඇ)	1994 වර්ෂයේදී බිම්කුලී ගෙවීම් පදනමින් වසර 30 ක් සඳහා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් මහලේවාය සහ කොහොලංකල ඉඩම් සඳහා වූ කුලී ගිවිසුම් සමාලෝචිත වර්ෂයේදී අවසන්ව තිබූ අතර එම ගිවිසුම්වල වලංගු කාල සීමාව අවසන් වීමට පෙර ගිවිසුම් යාවත්කාලීන කර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබීම නිසා එකී ඉඩම් නිෂ්පාදන කාර්යය සඳහා යොදාගැනීමේදී යම් අවදානම්කාරී තත්ත්වයක් පැනනැගිය හැකි බවට නිරීක්ෂණය කෙරේ.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ගිවිසුම යාවත්කාලීන කර ගැනීමට කාලීනව පියවර නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.
(ඈ)	සමාගම විසින් ඉකුත් වර්ෂ 05 ක කාලය තුළ අලාභහානි වාර්තා කිරීමට හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ දී රු.5,852,800 ක් වටිනා ජල පොම්ප සහ ජල මෝටර් 6 ක් මිලදී ගැනීමේදී තාක්ෂණික පිරිවිතරවල ඇතුළත් නොවූ කොන්දේසි පදනම් කරගෙන ලංසු ඇගයීම සිදු කර කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණි. තෝරාගත් සැපයුම්කරුගේ එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිය තහවුරු කර ගැනීමෙන් තොරව රු.892,800 ක එකතු කළ අගය මත බදු මුදලක්ද ඇතුළත් කර ගැනුම් ඇණවුම ඉදිරිපත් කර තිබුණ අතර, 2006 වර්ෂයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමෙන් තොරව හා අත්තිකාරම් සුරක්ෂණ හා කාර්ය සාධන බැඳුම්කර ලබා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත් වටිනාකමින් (VAT ඇතුළත්) සියයට 40 ක හෙවත් රු.2,341,120 ක අත්තිකාරමක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. සැපයුම්කරු විසින් සමාගම වෙත සපයා ඇති භාණ්ඩ පිරිවිතරවලට අනුකූලව පවතීද යන්න තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තහවුරු කර නොතිබුණි. එම භාණ්ඩ පිළිබඳව වරලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ සහය ඇතිව සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී භාණ්ඩ වල සන්නම් නාමය එක්සත් රාජධානිය (UK) ලෙස සඳහන් කර තිබුණු නමුත් ඒවා චීනයේ නිෂ්පාදිත විදුලි මෝටර් සහ ජල පොම්ප බවත්, සපයන ලද භාණ්ඩ අතුරින් මෝටර් 04 ක් හා පොම්ප 06 නවතම ඒවා බවට සැපයුම්කරු සඳහන් කර තිබුණත් සැපයූ විදුලි මෝටර් 04 ක් මෙයට පෙර භාවිතා කරන ලද නැවත භාවිතයට නුසුදුසු තත්ත්වයේ පවතින ඒවා බවත්, පෙර භාවිතා කරන ලද ජල පොම්ප නැවත තින්ත ආලේප කර ආයතනයට ලබා දී තිබුණ බව ද නිරීක්ෂණය විය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුගතව කටයුතු කළද අඩුපාඩු සිදුවිය හැකි බවත්, ආයතනයට සුදුසුම පොම්ප ලෙස SPP පොම්ප භාවිතා කර ඇති බැවින් එම පිරිවිතරයන් ප්‍රසම්පාදන දැන්වීමෙහි සඳහන් කර නොමැති බවත්, සැපයුම්කරුට ගෙවීමට ඇති මුදලින් වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කරන බවත්, සේවාව සැපයීමට අපොහොසත් වන්නේ නම් සිදුවී ඇති අලාභය අයකරගැනීමටත් පොම්පවල තිබුණු හදිසි අවශ්‍යතාවය මත ගිවිසුම් අත්සන් කිරීමට පෙර අත්තිකාරම් මුදල් ගෙවීම් කළ බව.	මෙම මිලදී ගැනීමට අදාළව විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමත්, නියමිත පිරිවිතර සකස් නොකළ හා එය ඇගයීම් කළ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් මේ පිළිබඳ වගකීමට යටත් කර අවශ්‍ය සුදුසු පියවර ගැනීමටත්, නිසි වෘත්තීය සැලකිල්ලෙන් තොරව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධව ක්‍රියාකර පාඩුව වගකිවයුතු පාර්ශ්වයෙන් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා වූ මාස 6 ක කාලයක් සඳහා භාවිතා කිරීමට සමාගම විසින් කිලෝ ග්‍රෑම් 1 ලුණු කැට ඇසුරුම් 500,000 ක් රු.3,103,400 ක් වැය කර මිලදී ගෙන තිබුණි. ඇසුරුම් ද්‍රව්‍ය අවශ්‍යතාවය අනුව ප්‍රසම්පාදනය කළ යුතු භාණ්ඩ හා ඒවායේ ප්‍රමාණය ප්‍රසම්පාදන අංශය විසින් තීරණය කළ යුතු වුවත්, ඊට පටහැනිව මිලදී ගත යුතු ඇසුරුම් ප්‍රමාණය 500,000 ලෙසට තාක්ෂණ ඇගයීම් කමිටුව තීරණය කර තිබුණි. තාක්ෂණ ඇගයීම් කමිටුව මිලදී ගත යුතු ප්‍රමාණය තීරණය කිරීමේදී එම අවස්ථාවේ බූන්දල ලේවායේ තිබූ	පිළිතුරු ඉදිරිපත් කර නොමැත	මෙම මිලදී ගැනීමට අදාළ පූර්ණ හා විනිවිද පරීක්ෂණයක් සිදුකර නිසි සැලකිල්ලෙන් කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධව සුදුසු නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු අතර

	ඇසුරුම් පැකට් ඒකක 409,170 ක් සැලකිල්ලට ගෙන නොතිබුණු අතර, එහි ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන කළමනාකරු විසින්ද 2024 අප්‍රේල් 01 දිනට ඇසුරුම් ඒකක ශේෂය ශුන්‍ය මට්ටමේ පවතින බව දක්වමින් ඒකක 500,000 සඳහා අවශ්‍යතාවය දක්වමින් ඉන්ඩෙන්ට් පතක්ද ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් 2024 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා වූ මාස 6 ක කාල සීමාව තුළ කිලෝ ග්‍රෑම් 1 සංස්ථා කැට ලුණු පැකට් අලෙවිය සඳහා ඇසුරුම් මිලදී ගෙන තිබුණද, අපේක්ෂිත පරිදි අලෙවියක් සිදු වී නොතිබුණු බැවින් 2024 අගෝස්තු 09 දිනටත් සමාගම සතුව එකතුව රු.7,919,052 ක කිලෝ ග්‍රෑම් 1 කැට ලුණු ඇසුරුම් ඒකක 1,068,985 ක් නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.		සමාගමට සිදු වූ පාඩුව ඔවුන්ගෙන් අයකර ගත යුතුය.
(ඇ)	2022 ජුනි 30 දින කිලෝ 20 මුද්‍රිත පොලිතින් පිටකවර ඒකක 150,000 ක් මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනයේදී එකතු වටිනාකම රු.5,175,000 ක් වූ භාණ්ඩ අවස්ථා 03 කදී ගබඩාවට ලැබී තිබුණි. සැපයීම් සිදු කළ තුන්වන අවස්ථාවේ දී සමාගම ඉල්ලුම් කළ ප්‍රමාණය ඉක්මවා පිටකවර ඒකක 44,540 ක් ද ඇතුළත්ව රු.4,129,132 ක් වටිනා කවර ඒකක 119,685 ක් ගබඩාවට ලැබී තිබුණු අතර, එම තොගයම තත්ත්ව පරීක්ෂණ වාර්තා අනුව ප්‍රතික්ෂේප කර තිබුණි. 2023 දෙසැම්බර් 27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණ අංක 472.22 අනුව භාවිතයට නුසුදුසු ගැනුම් ඇණවුම් නොමැතිව ලද ඒකක 44,540 ක අතිරික්තය භාරගත් නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර තිබුණද, එම තීරණයට අනුගත නොවී අතිරික්ත සැපයුම සඳහා GRN නිකුත් කිරීමට සභාපතිවරයා විසින් ගබඩා භාරකරුට 2024 පෙබරවාරි 19 දින අනුමැතිය ලබාදී තිබුණි. විගණන පරීක්ෂාව සිදුකළ 2024 ඔක්තෝබර් 25 දින වන විටත් අතිරික්තව ලද තොගය භාවිතා කර නොතිබූ අතර එය වසර 01 මාස 08 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි. එමෙන්ම ප්‍රසම්පාදන සිදුකළ 2022 ජුනි මස මෙම තොග ඒකකයක මිල රු.34.50 ක් වූ අතර පසුව 2023 අගෝස්තු මස වන විට ඒකකයක මිල රු.19.24 ක් වූයෙන් තොග අවශ්‍යතාවය ඉක්මවා මිලදීගැනීම තුළ ඒකකයකට රු.15.26 ක් බැගින් වැඩිපුර ගෙවීම වෙනුවෙන් රු.1,826,393 ක පාඩුවක් ද සමාගමට සිදුව තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	මෙම මිලදී ගැනීමට අදාළ පූර්ණ හා විනිවිද පරීක්ෂණයක් සිදුකර නිසි සැලකිල්ලෙන් කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධව සුදුසු නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු අතර සමාගමට සිදු වූ පාඩුව ඔවුන්ගෙන් අයකර ගත යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ ක්ෂේත්‍ර අංශ පොල් අතු රැස් කරන ගබඩාව ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත සිවිල් වැඩ වටිනාකම රු.1,368,675 ක් වුවත් එයට ශ්‍රම පිරිවැය ඇතුළත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ජුනි මස එකී ඉදිකිරීම සඳහා රු.2,475,586 ක වියදම් දරා අවසන් කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු සැකසීම විධිමත්ව සිදු නොකිරීමත්, නියමිත කාලයක් ඇතුළත ඉදිකිරීම් නිම කිරීම සඳහා ඉලක්ක ගත දිනයන් ලබාදී නොතිබීම සහ මුළු පිරිවැය ඉක්මවා රු.1,106,911 ක් වැය කර තිබීම නිසා ඉදිකිරීම් වෙනුවෙන් ස්ථාපිත අභ්‍යන්තර පාලනය හා අධීක්ෂණය දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ඇස්තමේන්තුකරණය නිසි වෘත්තීය සැලකිල්ලෙන් කිරීමටත් එසේ නොකළ නිලධාරීන් සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතු අතර මේ සම්බන්ධව අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය.